**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**අධ්‍යාපන පීඨය**
**අධ්‍යාපනපති උපාධි වැඩසටහන -2024/2025**
**අවසාන පරීක්ෂණය**
**STP9617 - ගුරු අධ්‍යාපනය**
**කාලය - පැය තුන (03) යි.**

---

**දිනය : 2026.02.07** **වේලාව : ප.ව.01.30 - ප.ව.04.30 දක්වා**

---

**ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**

01. (i.) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගුරු අධ්‍යාපන ආයතන හඳුනා ගෙන වර්ගීකරණය කර, ගුරුවරුන් ගේ වෘත්තීය සංවර්ධනය සම්බන්ධයෙන් ඒවායේ භූමිකාවන් කෙටියෙන් පරීක්ෂා කරන්න. (ලකුණු 05)

(ii.) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අවශ්‍යතා වෙනස්වීමේ පසුබිම තුල ගුරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයේ (CPD – Continuous Professional Development) ඇති වැදගත්කම විස්තර කරන්න. ඒ යටතේ ඉගැන්වීමේ ගුණාත්මකභාවයට, ගුරු පුහුණුවට සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට ඇති බලපෑම පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න. (ලකුණු 10)

(iii.) ශ්‍රී ලංකාවේ ගුරුවරුන් තම වෘත්තීය සංවර්ධනය සඳහා මුහුණ දෙන ප්‍රධාන අභියෝග දෙකක් **(02)** විවේචනාත්මකව විශ්ලේෂනය කර අනාගත අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (Continuous Professional Development CPD) වැඩ සටහන් ශක්තිමත් කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රමෝපායයන් යෝජනා කරන්න. (ලකුණු 10)

02. (i.) ඉගැන්වීමේ දී ගුරුවරුන් සඳහා 'වෘත්තීය ආචාර ධර්ම' සංකල්පය නිර්වචනය කර, ශ්‍රී ලංකාවේ ගුරුවරුන් සඳහා ක්‍රියාත්මක කිරීමට ඔබ අපේක්ෂා කරන ආචාර ධර්ම තුනක් **(03)** හඳුනාගන්න. (ලකුණු 05)

(ii.) පන්ති කාමර කළමනාකරණය, සිසුන් සහ දෙමාපියන් සමඟ සම්බන්ධතා සහ පුලුල් පාසල් ප්‍රජාව සමග ඇති සබඳතා කෙරෙහි අවධානය යොමුකරමින් වර්තමාන ශ්‍රී ලාංකික ගුරුවරුන් සඳහා වෘත්තීය ආචාර ධර්ම වල වැදගත්කම හඳුනාගන්න. (ලකුණු 10)

(iii.) ශ්‍රී ලංකාවේ වර්තමාන සමාජ සංදර්භයට අනුව වෘත්තීය ආචාර ධර්ම ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රතිපත්ති සම්පාදකයන් මුහුණ දෙන අභියෝග පරීක්ෂා කරන්න. (ලකුණු 10)

03. (i.) උදාහරණ දෙකක් ඇසුරින් 'ඉගැන්වීම වෘත්තියක්' ලෙස අර්ථ දක්වන්න. (ලකුණු 05)

(ii.) පන්ති කාමර ඉගැන්වීම, සිසු සංවර්ධනය සහ සමාජ සංවර්ධනය සම්බන්ධයෙන් වෘත්තිකයන් ලෙස ගුරුවරුන් ගේ භූමිකා සහ වගකීම් මොනවාදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(iii.) ගුරු වෘත්තිය 'වෘත්තියක් ලෙස' පිළිගැනීමට ඇති ප්‍රධාන අභියෝග **තුනක් (03)** විවේචනාත්මකව පරීක්ෂා කර, ශ්‍රී ලාංකික සන්දර්භය ඔස්සේ ගුරු වෘත්තිය ශක්තිමත් කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

04. (i.) ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන ක්‍රමය වර්තමානයේ දී මුහුණ දෙන ප්‍රධාන ගැටලු **තුනක් (03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) ශ්‍රී ලංකාවේ වර්තමාන සමාජ අවශ්‍යතා සඳහා ගුරු පුහුණු ක්‍රියාවලියේ ඵලදායකත්වය කෙරෙහි බලපාන විෂයමාලාව ආශ්‍රිත ගැටළු විස්තර කරන්න. (ලකුණු 10)

(iii.) එම ගැටළුවලට විසඳුම් ලබාදිය හැකි සහ ශ්‍රී ලංකාවේ ආරම්භක ගුරු පුහුණුවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කළ හැකි ප්‍රායෝගික විසඳුම් විවේචනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

05. (i.) ගුරු අධ්‍යාපන පද්ධති තුළ නැගී එන නව ප්‍රවනතා **තුනක් (03)** ලියන්න. (ලකුණු 05)

(ii.) මෙම නව ප්‍රවනතා ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපනයට හඳුන්වා දිය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

(iii.) ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපනයට මෙම ගෝලීය ප්‍රවනතාවන් (Global Trends) ඵලදායි ලෙස ඒකාබද්ධ කිරීමේ දී ඇතිවන අභියෝග සහ ඒ සඳහා යෝජිත විසඳුම් විවේචනාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 10)

06. (i.) 'ගුරුවරුන් සවිබලගැන්වීම' (Teacher empowerment) යන්න නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii.) ශ්‍රී ලංකාවේ ගුරුවරුන් සවිබල ගැන්වීමේ දී වැදගත් වන අංග **තුනක් (03)** සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(iii.) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සන්දර්භය තුළ ගුරුවරුන් සවිබලගැන්වීම සම්බන්ධයෙන් පවතින ප්‍රධාන අභියෝග විවේචනාත්මකව විමර්ශනය කර එය ප්‍රවර්ධනය කිරීම සඳහා ගතහැකි උපායමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 10)

- හිමිකම් ඇවිරිණි. -